# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1996 අංක 32 දරන ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජ්‍යායතන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1996 නොවැම්බර් මස 13 වන දින]

(ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.)

---

1996 නොවැම්බර් මස 15 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : ශත. 90 යි. තැපැල් ගාස්තුව : රු. 2.00 යි.

**1996 අංක 32 දරන ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජ්‍යායතන (සංශෝධන) පනත**

එල්. ඩී.— ඕ. 42/96

**[සහතිකය සටහන් කළේ 1996 නොවැම්බර් මස 13 වන දින]**

**1981 අංක 54 දරන ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජ්‍යායතන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1996 අංක 32 දරන ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජ්‍යායතන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. කෙටි නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1981 අංක 54 දරන ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජ්‍යායතන පනතේ 2 වන වගන්තියේ "ජලජ සම්පත් පිළිබඳ විෂයය සම්බන්ධයෙන් පර්යේෂණ, සංවර්ධන හා කළමනාකරණ" යන වචන වෙනුවට "ජලජ සම්පත්, ජලමාන මැනුම් සහ නාවික සිතියම්කරණය පිළිබඳ විෂයයන් සම්බන්ධයෙන් පර්යේෂණ, සංවර්ධන, කළමනාකරණ හා සංරක්ෂණ" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. 1981 අංක 54 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

(i) ඒ වගන්තියේ (ආ) ඡේදයේ —

(අ) "කළමනාකරණය කිරීම සහ සංවර්ධනය කිරීම" යන වචන වෙනුවට, "කළමනාකරණය, සංරක්ෂණය සහ සංවර්ධනය" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ ඡේදයේ (i) වන අනුඡේදයේ "සාගර විද්‍යාව ;" යන වචන වෙනුවට "සාගර විද්‍යාව සහ ජලමාන විද්‍යාව ;" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) ඒ ඡේදයේ (iv) වන අනුඡේදයේ "මාළු මෙන්ම සම්බන්ධිත නිෂ්පාදනයන් ද" යන වචන වෙනුවට "මාළු මෙන්ම ජලජ නිෂ්පාදන ද" යන වචන ආදේශ කිරීමෙන් ;

2-ඩී 041392-6,105 (96/10)

(ii) ඒ වගන්තියේ (ඇ) ඡේදයේ "කළමනාකරණය කිරීම හා සංවර්ධනය කිරීම" යන වචන වෙනුවට "කළමනාකරණය කිරීම, සංරක්ෂණය කිරීම හා සංවර්ධනය කිරීම" යන වචන ආදේශ කිරීමෙන් ;

(iii) ඒ වගන්තියේ (ඈ) ඡේදයේ "පාලනය කිරීමෙහි හා කළමනාකරණය කිරීමෙහි" යන වචන වෙනුවට "සංරක්ෂණය කිරීමෙහි, පාලනය කිරීමෙහි හා කළමනාකරණය කිරීමෙහි" යන වචන ආදේශ කිරීමෙන් ;

(iv) ඒ වගන්තියේ (ඉ) ඡේදයේ "සංවර්ධනය කිරීම සඳහා" යන වචන වෙනුවට "කළමනාකරණය කිරීම, සංරක්ෂණය කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා" යන වචන ආදේශ කිරීමෙන් ;

(v) ඒ වගන්තියේ (ඉ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ඉඉ) වෙරළාසන්න හා අක්වෙරළ ප්‍රදේශවල සහ අභ්‍යන්තර ජල ප්‍රදේශවල, ජලමාන විද්‍යාත්මක දත්ත සහ නාවික තොරතුරු එකතු කිරීම, පිරිසැකසුම් කිරීම සහ පළකිරීම භාරගැනීම සහ ශ්‍රී ලංකාවෙහි ඒ කටයුතු පිළිබඳ සමස්ත පාලනය ;".

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) ඒ වගන්තියේ (උ) ඡේදයේ "කළමනාකරණය කිරීම හා සංවර්ධනය කිරීම" යන වචන වෙනුවට "කළමනාකරණය කිරීම, සංරක්ෂණය කිරීම හා සංවර්ධනය කිරීම" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ වගන්තියේ (එ) ඡේදයේ (i) වන අනුඡේදයේ "ධීවර කර්මාන්තය පිළිබඳ විෂයය" යන වචන වෙනුවට "ධීවර කර්මාන්තය සහ ජලජ සම්පත් සංවර්ධනය පිළිබඳ විෂයය" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) ඒ වගන්තියේ (ඒ) ඡේදයේ (ii) වන අනුඡේදයේ "කළමනාකරණය කිරීම හා සංවර්ධනය කිරීම" යන වචන වෙනුවට "කළමනාකරණය කිරීම, සංරක්ෂණය කිරීම හා සංවර්ධනය කිරීම" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) ඒ වගන්තියේ (ඔ) ඡේදයේ "කළමනාකරණ, සංවර්ධන" යන වචන වෙනුවට "කළමනාකරණ, සංරක්ෂණ, සංවර්ධන" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඉ) ඒ වගන්තියේ (ක) සහ (ග) ඡේද, ඒ වගන්තියේ පිළිවෙලින් (ජ) සහ (ට) ඡේද යනුවෙන් නැවත අංක යෙදීමෙන් ; සහ

(ඊ) ඒ වගන්තියේ (ඕ) ඡේදය වෙනුවට, පහත දැක්වෙන අලුත් ඡේද ආදේශ කිරීමෙන් :—

"(ඕ) ශ්‍රී ලංකාවේ ජාතික ජලජ සම්පත් හා අක් වෙරළ ප්‍රදේශ පිළිබඳ සමීක්ෂණ ආරම්භ කිරීම හා පවත්වාගෙන යාම ;

(ක) ජලමාන විද්‍යාත්මක දත්ත සහ නාවික තොරතුරු එක්රැස් කිරීම, පිරිසැකසුම හා ඉදිරිපත් කිරීම සඳහා ප්‍රමිති සහ කාර්ය පටිපාටි ඇති කිරීම ;

(ග) ජලමාන විද්‍යාත්මක මිනුම්කරුවන් ලෙස ක්‍රියා කිරීම පිණිස තැනැත්තන් පුහුණු කිරීම, විභාග පැවැත්වීම, ජාතික වෘත්තීය ප්‍රමිති ඇති කිරීම සහ ඒ තැනැත්තන්ට බලපත්‍ර නිකුත් කිරීම ;

(ච) ශ්‍රී ලංකාව තුළ සියලු ජලමාන විද්‍යාත්මක සහ නාවික සිතියම් කටයුතු පාලනය කිරීම සහ සම්බන්ධීකරණය කිරීම.".

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) ඒ උපවගන්තියේ (අ) ඡේදයේ "කළමනාකරණ, පර්යේෂණ" යන වචන වෙනුවට "කළමනාකරණ, සංරක්ෂණ, පර්යේෂණ" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ උපවගන්තියේ (ආ) ඡේදය වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ආ) නිල බලයෙන් පත් වන පහත දැක්වෙන සාමාජිකයන් :—

(i) ධීවර හා ජලජ සම්පත් සංවර්ධන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වශයෙන් තත්කාලයෙහි ධුරය දරන තැනැත්තා හෝ ඒ අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ඔහුගේ නියෝජිතයා ;

(ii) වරාය හා නාවික කටයුතු විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වශයෙන් තත්කාලයෙහි ධුරය දරන තැනැත්තා හෝ ඒ අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ඔහුගේ නියෝජිතයා ;

(iii) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වශයෙන් තත්කාලයෙහි ධුරය දරන තැනැත්තා හෝ ඒ අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ඔහුගේ නියෝජිතයා ;

(iv) විද්‍යා කටයුතු විෂයය භාර අමාත්‍යවරයාගේ ලේකම්වරයා වශයෙන් තත්කාලයෙහි ධුරය දරන තැනැත්තා හෝ ඒ අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ඔහුගේ නියෝජිතයා ;

(v) ශ්‍රී ලංකා නාවික හමුදාවේ හමුදාපති වශයෙන් තත්කාලයෙහි ධුරය දරන තැනැත්තා හෝ ඒ හමුදාපති විසින් නම් කරනු ලබන ඔහුගේ නියෝජිතයා ;

(vi) මිනුම්පතිවරයා වශයෙන් තත්කාලයෙහි ධුරය දරන තැනැත්තා ;

(vii) ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අධ්‍යක්ෂවරයා වශයෙන් තත්කාලයෙහි ධුරය දරන තැනැත්තා ; සහ

(viii) නියෝජ්‍යායතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් තත්කාලයෙහි ධුරය දරන තැනැත්තා.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (උ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(උ) ශ්‍රී ලංකාවෙහි ජලජ සම්පත් කළමනාකරණය, සංවර්ධනය හා සංරක්ෂණය කිරීමට අදාළ කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයාට උපදෙස් දීම හා නිර්දේශ ඉදිරිපත් කිරීම ;

(ඌ) ජලජ සම්පත් කළමනාකරණ, සංවර්ධන, සංරක්ෂණ හා පර්යේෂණ සැලැස්ම පිළියෙල කිරීම හා එය අඛණ්ඩව සමාලෝචනයට භාජන කිරීම ;

(එ) ජලමාන විද්‍යාත්මක මිනුම්, ජලමාන විද්‍යාත්මක පැහැදිළි සටහන් පත්‍ර, සිතියම් සහ නාවික ප්‍රකාශන සහතික කිරීම පිණිස නිසි තැනැත්තකු පත් කිරීම ;

(ඒ) නියෝජ්‍යායතනයේ කාර්ය මණ්ඩලය පත් කිරීමට, සේවයෙන් පහ කිරීමට හෝ එහි විනය පාලනයට අදාළ නියෝජ්‍යායතනයේ බලතල හෝ කාර්ය අතුරින් කිසිවක් සභාපතිවරයාට හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයාට පවරා දීම ;

(ඔ) නියෝජ්‍යායතනයේ කටයුතු පරිපාලනය කිරීම හා කළමනාකරණය කිරීම.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 13, 14, 15 සහ 16 වන වගන්ති ඉවත් කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන, 14 වන, 15 වන සහ 16 වන වගන්ති මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"විද්‍යාත්මක හා තාක්ෂණික කමිටුව.

17. (1) පහත සඳහන් තැනැත්තන්ගෙන් (මෙහි මින් මතු "කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන) විද්‍යාත්මක හා තාක්ෂණික කමිටුව යනුවෙන් හඳුන්වනු ලබන නියෝජ්‍යායතනයේ ස්ථාවර කමිටුවක් සංස්ථාපනය විය යුතු ය :—

(අ) සභාපතිවරයා ;

(ආ) අධ්‍යක්ෂ ජනරාල්වරයා ;

(ඇ) නියෝජ්‍යායතනයේ පර්යේෂණ කොට්ඨාසවල සහ ජලමාන විද්‍යාත්මක කාර්යාලයේ ප්‍රධානීන් ;

(ඈ) වෙරළ සංරක්ෂණ අධ්‍යක්ෂවරයා ;

(ඉ) අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරනු ලැබිය යුතු, ඒ අමාත්‍යාංශයේ නියෝජිතයන් දෙදෙනෙක් ;

(ඊ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු, ජල ජීවී කර්මාන්තයේ නියෝජිතයන් දෙදෙනෙක් ;

(උ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු විද්‍යාඥ ප්‍රජාවෙහි විශිෂ්ට සාමාජිකයන් දෙදෙනෙක් ; සහ

(ඌ) මණ්ඩලය විසින් නම් කරනු ලැබිය යුතු මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනෙක්.

(2) (1) වන උපවගන්තියේ (ඊ) සහ (උ) ඡේද යටතේ පත් කරනු ලබන කමිටුවේ සෑම සාමාජිකයකු විසින් ම මියයාමේ, ඉල්ලා අස්වීමේ හෝ ඉවත් කරනු ලැබීමේ හේතුවෙන් ධුරය කලින් හිස් කළහොත් මිස, අවුරුදු දෙකක කාලයක් ධුරය දැරිය යුතු අතර, ඔහු නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු විය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (ඊ) සහ (උ) ඡේද යටතේ පත් කරනු ලැබූ යම් සාමාජිකයකු සිය ධුර කාලය අවසන් වීමට පෙර ධුරය හිස් කරනු ලබන අවස්ථාවක, එම සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවී ඇති කාලය තුළ ධුරය දැරීම සඳහා, අමාත්‍යවරයා විසින් ඔහු වෙනුවට වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම.

**9**. ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තියේ (ඇ) ඡේදයේ "අවස්ථාවෝචිත පරිදි, මණ්ඩලය විසින් හෝ සභාව විසින්" යන වචන වෙනුවට "මණ්ඩලය විසින්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කිරීම.

**10**. ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තියේ (1) වන උප වගන්තියේ "දෙමසකට" යන වචනය වෙනුවට "තෙමසකට" යන වචනය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.

**11**. ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) "සභාවේ" යන වචනය වෙනුවට "කමිටුවේ" යන වචනය ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ වගන්තියේ පාර්ශ්ව සටහනෙහි "සභාවේ" යන වචනය වෙනුවට, "කමිටුවේ" යන වචනය ආදේශ කිරීමෙන්.

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) ඒ වගන්තියේ "සභාවේ" යන වචනය සඳහන් වන සෑම තැනක ම ඒ වචනය වෙනුවට "කමිටුවේ"යන වචනය ආදේශ කිරීමෙන් ;

(ආ) "13 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ පත් කරනු ලැබූ" යන වචන හා ඉලක්කම් වෙනුවට, "17 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඊ) සහ (උ) ඡේද යටතේ පත් කරනු ලැබූ" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ; සහ

(ඇ) ඒ වගන්තියේ පාර්ශ්ව සටහනේ "සභාවේ" යන වචනය වෙනුවට "කමිටුවේ" යන වචනය ආදේශ කිරීමෙන්.

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) ඒ වගන්තියේ "සභාවේ" හෝ "සභාව" යන වචනය සඳහන් වී ඇති සෑම තැනක ම ඒ වෙනුවට, පිළිවෙලින් "කමිටුවේ" හෝ "කමිටුව" යන වචනය ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ වගන්තියේ පාර්ශ්ව සටහනේ "සභාවේ" යන වචනය වෙනුවට "කමිටුවේ" යන වචනය ආදේශ කිරීමෙන්.

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :- ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) "සභාවේ" යන වචනය වෙනුවට "කමිටුවේ" යන වචනය ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ඒ වගන්තියේ පාර්ශ්ව සටහනේ "සභාවේ" යන වචනය වෙනුවට "කමිටුවේ" යන වචනය ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියෙහි අලුතින් 38අ වගන්තිය ඇතුළත් කිරීම.

**15**. ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 38අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :—

"වාර්තා ආදිය පළ කිරීම පිළිබද සීමා.

38අ. අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිඛිත අවසරය කලින් ලබා නොගෙන, නියෝජ්‍යායතනයේ කිසිදු නිලධරයකු විසින් නියෝජ්‍යායතනයේ යම් වාර්තාවක් හෝ පර්යේෂණ නිගමනයක් හෝ පළ කිරීම හෝ පළ කිරීමට සැලැස්වීම හෝ නොකළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තිය සංශෝධනය කිරීම.

**16**. ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) පිළිවෙළින් "ලංකා ධීවර සංස්ථාව" සහ "ලංකා ධීවර වරාය සංස්ථාව" යන යෙදුම්වල අර්ථ නිරූපණ ඉවත් කිරීමෙන් ;

(ආ) "වෙරළබඩ තෙත් බිම්" යන්නෙහි අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් :—

' "ස්ව සම්පත් කලාපය" යන්නෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 22 දරන සමුද්‍රීය කලාප පනතේ 5 වන වගන්තිය යටතේ කරන ලද නිවේදනයක් මගින් ශ්‍රී ලංකාවේ ස්ව සම්පත් කලාපය ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබූ ප්‍රදේශය අදහස් වේ ; '

(ඇ) "අභ්‍යන්තර ජල ප්‍රදේශය" යන්නෙහි අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් :—

' "අමාත්‍යවරයා" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන ව්‍යවස්ථාව යටතේ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන විෂයය භාරව සිටීම පිණිස පත්කරන ලද අමාත්‍යවරයා අදහස් වේ ; '

(ඈ) "අක් වෙරළ ප්‍රදේශ" යන්නෙහි අර්ථ නිරූපණයේ "සියලු ප්‍රදේශ අදහස් වේ ;" යන වචන වෙනුවට "සියලු ප්‍රදේශ අදහස් වන අතර ස්ව සම්පත් කලාපය ද ඊට ඇතුළත් වේ ;" යන වචන ආදේශ කිරීමෙන්.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**17**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.